# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2021 = 100) : 2023 දෙසැම්බර්

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ 2013=100 වූ දර්ශක යොමු කාලය 2023 ජනවාරි මාසයේ සිට 2021=100 වන නව දර්ශක යොමු කාලයට යාවත්කාලීන කර ඇත. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2023 දෙසැම්බර් මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය (Headline Inflation) 4.2%ක් බව එහි වැ.බ. අධ්‍යක්ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. 2023 නොවැම්බර් මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 2.8%ක් ලෙස වාර්තා විය. 2023 දෙසැම්බර් මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 0.7% ක හා ආහාර නොවන කාණ්ඩයේ 3.5%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. ආහාර කාණ්ඩයේ ලක්ෂ්‍යමය උද්ධමනය 2023 නොවැම්බර් මාසයේදී -2.2% සිට 2023 දෙසැම්බර් මාසයේදී 1.6% දක්වා වැඩිවී ඇති අතර, ආහාර නොවන කාණ්ඩයේ ලක්ෂ්‍යමය උද්ධමනය 2023 නොවැම්බර් මාසයේදී 7.1% සිට 2023 දෙසැම්බර් මාසයේදී 6.3% දක්වා අඩු වී ඇත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (2021=100) මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2023 නොවැම්බර් මාසයේ 206.0ක් වූ දර්ශකාංකය, 2023 දෙසැම්බර් මාසයේ දී 208.8 ක් දක්වා වැඩි වී ඇති බව වාර්තා විය. මෙය 2023 නොවැම්බර් මාසයට සාපේක්ෂව 2023 දෙසැම්බර් මාසයේ දර්ශකාංකය 2.8ක වැඩිවීමක් එනම් 1.38 ක ප්‍රතිශතාංක වැඩිවීමක් පෙන්නුම් කරයි. මෙම මාසික වෙනස්වීම සඳහා ආහාර කාණ්ඩය 1.55% කින් වැඩිවීම සහ ආහාර නොවන කාණ්ඩය 0.17% කින් අඩුවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැළකුවිට මිලෙහි වැඩිවීමක් ප්‍රධාන වශයෙන් වාර්තා වී ඇත්තේ එළවළු, ලොකුළූණු, අමුමිරිස්, අළුත් මාළු, බිත්තර, සහල්, කුකුළුමස්, සීනි, පොල්, රතුළූණු, අර්තාපල්, පොල්තෙල් සහ මිරිස් කුඩු යන ආහාර ද්‍රව්‍යවල වේ. එහෙත් දෙහි, කරවල, ටින්මාළු, සුදුළූණු, මයිසූර් පරිප්පු සහ තිරිඟුපිටි යන ආහාර ද්‍රව්‍ය වල මිලෙහි අඩුවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2023 දෙසැම්බර් මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය අඩුවීම සඳහා 'ප්‍රවාහන' *(පෙට්‍රල්, ඩීසල්)*, 'රෙදිපිළි හා පාවහන්' *(රෙදිපිළි)*, 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' *(ගොඩනැගිලි ඉදිකිරීමේ ද්‍රව්‍ය)*, 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' *(බුලත්)* සහ 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එහෙත් 'ආපනශාලා සහ හෝටල්' යන කාණ්ඩයට අයත් අයිතමයන්ගේ මිලෙහි වැඩිවීමක් වාර්තා වී ඇත. තව දුරටත් සළකා බැලීමේදී 'විවිධ භාණ්ඩ හා සේවා' කාණ්ඩයට අයත් අයිතමයන්ගේ මිලෙහි ඉතා සුළු අඩුවීමක් වාර්තා වී ඇත. මේ අතර 'සෞඛ්‍ය', 'සන්නිවේදන', 'විනෝදාත්මක හා සංස්කෘතික' සහ 'අධ්‍යාපන' යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල දෙසැම්බර් මාසය පුරා නොවෙනස්ව පැවති බවත් වාර්තා වී ඇත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (පාද වර්ෂය: 2021=100) ලක්ෂ්‍යමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්ඡාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිබිඹු වන යටිදැරි උද්ධමනය (Core Inflation), 2023 නොවැම්බර් මාසයේ 0.8% සිට 2023 දෙසැම්බර් මාසයේදී 0.9% දක්වා වැඩිවීමක් වාර්තා විය.

### ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2021=100), ජාතික පාරිභෝගික මිල දර්ශකය (යටිදැරි) , ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සහ ලක්ෂ්‍යමය යටිදැරි උද්ධමනයේ විචලනය




## ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2021 = 100)

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) | | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) |
| | | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | |
| **2022** | දෙසැ. | 200.4 | 232.4 | 179.8 | 188.0 | 0.0 | 0.1 | | | | |
| **2023** | ජන. | 201.8 | 232.8 | 181.8 | 189.8 | 0.7 | 1.0 | 53.2 | 53.6 | 52.9 | 52.0 |
| | පෙබ. | 204.1 | 228.1 | 188.6 | 189.4 | 1.1 | -0.2 | 53.6 | 49.0 | 57.4 | 50.1 |
| | මාර්තු | 204.8 | 223.2 | 193.0 | 188.1 | 0.3 | -0.7 | 49.2 | 42.3 | 54.9 | 44.2 |
| | අප්‍රේල් | 202.7 | 223.8 | 189.1 | 188.2 | -1.0 | 0.1 | 33.6 | 27.1 | 39.0 | 31.8 |
| | මැයි | 203.1 | 226.1 | 188.3 | 187.8 | 0.2 | -0.2 | 22.1 | 15.8 | 27.6 | 21.6 |
| | ජූනි | 203.3 | 228.4 | 187.1 | 186.5 | 0.1 | -0.7 | 10.8 | 2.5 | 18.3 | 11.3 |
| | ජූලි | 201.9 | 227.5 | 185.3 | 188.0 | -0.7 | 0.8 | 4.6 | -2.5 | 10.9 | 6.3 |
| | අගෝ. | 201.9 | 224.6 | 187.3 | 188.7 | 0.0 | 0.4 | 2.1 | -5.4 | 9.0 | 4.1 |
| | සැප්. | 203.5 | 226.7 | 188.5 | 189.0 | 0.8 | 0.2 | 0.8 | -5.2 | 5.9 | 1.7 |
| | ඔක්. | 203.6 | 224.1 | 190.4 | 189.2 | 0.0 | 0.1 | 1.0 | -5.2 | 6.3 | 0.6 |
| | නොවැ. | 206.0 | 228.1 | 191.8 | 189.3 | 1.2 | 0.1 | 2.8 | -2.2 | 7.1 | 0.8 |
| | දෙසැ. | 208.8 | 236.2 | 191.2 | 189.7 | 1.4 | 0.2 | 4.2 | 1.6 | 6.3 | 0.9 |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව